## රබර් නැවත වගා කිරීමේ සහනාධාර අරමුදල - 2012

1. මූල්‍ය ප්‍රකාශන

1.1 අගතකර විගණන මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වල වැදගත් බව හේතුවෙන් 2012 දෙසැම්බර් 31 දිනට රබර් නැවත වගා කිරීමේ සහනාධාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහ මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළයෙල කර නොමැති බව මා දරන්නා ව මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළබඳ අදහස දැක්වීම

1.2.1 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

ක්‍රියාකාරී තත්ත්වයේ නොපවතින මෙම අරමුදල පනතේ විධිවිධාන අනුව ඈවර කිරීම සඳහා අඛණ්ඩ පැවැත්මක් නොමැති පදනමින් යුක්තව ගිණුම් ඉදිරිපත් කළයුතු වුවත් එසේ ක්‍රියාකර නොතිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන්කරනු ලැබේ.

(අ) රබර් නැවත වගා කිරීමේ අරමුදලට අයත් රු.63,438,233 ක්වටිනා සථාවර වත්කම් භෞතිකව හඳුනාගෙන නොතිබූ අතර මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා නොකරන මෙම වත්කම් වෙනුවෙන් සමාලොචිත වර්ෂයේදී රු.904,699 ක් ක්ෂය ප්‍රතිපාදනය කරතිබුණි.

(ආ) වායු සමීකරණ යන්ත්‍ර හා කාර්යාලීය ලී බඩු උපකරණ රු.7,609,866 ක් එකම ගිණුමක සටහන් කර තිබුණි.

1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.

පහත සඳහන් විෂයයන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් නොවීම හෙතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හො පිළගැනීමට හො නොහැකි විය.

| | විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් | 63,438,233 | සමීක්ෂණ මණ්ඩල වාර්තා, ස්ථාවර වතක්ම් ලේඛනය, හමිකම් ඔප්පු |
| (ආ) | අත්තිකාරම් | 15,220,514 | විසතරාත්මක උපලේඛන , ශේෂසනාථකිරීම් |
| (ඇ) | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් | 9,617,628 | විසතරාත්මක උපලේඛන, ශේෂ සනාථ කිරීම් |
| (ඈ) | ලැබිය යුතු ශේෂ | 96,544,110 | මූලාශ්‍ර ලියවිලි, ශේෂ සනාථ කිරීම් |
| (ඉ) | ගෙවිය යුතු ශේෂ | 18,871,810 | විසතරාත්මක උපලේඛන, ශේෂ සනාථ කිරීම් |

1.2.4 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන්කරනු ලැබේ.

(අ) ජංගම වතකම් යටතේ දැක්වෙන රු.96,544,110ක්ව ශේෂ 13 ක්වසර 08 ක කාලයක සට හඳුනාගෙන අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වටිනාකම රු.18,871,810 ක් ව වගකීම් විෂයයන් 14 ක් වසර 07 ක පමණ කාලයක සට පැවත එනු ලබන අතර, මෙම වගකීම් නිවැරදිව හඳුනාගෙන නිරවල් කිරීමට කටයුතු කර නොතිබුණි.

2. මූල්‍ය සමාලොචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් කටයුතු වල ප්‍රතඵලය රු.383,580 ක ඌනතාවයක් ව අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.392,390ක් වයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහ රු.8,810 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. අරමුදලේ මුළු ආදායම ආයොජන පොලී ආදායමෙන් පමණක් සමන්විත ව අතර එය රු. 561,119ක් විය.

3. මෙහෙයුම් සමාලොචනය
-----------------------------

3.1 කාර්යසාධනය
------------------

3.1.1 අරමුදලේ පැවැත්ම
---------------------

ක්‍රියාකාර තත්වයේ නොපවතින මෙම අරමුදල ඈවර කිරීම පිණිස අදාල පනතේ විධි විධාන අනුව හා 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සකස කළ විගණිත ගිණුම්හ දැක්වෙන වත්කම් හා වගකීම් නිරවල් කර එයට විගණකාධිපතිගේ එකගතාවය ලබා ගත යුතු බව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද 2011 ඔක්තොබර් 21 දිනැති ලිපිය මගින් දැනුම් දී තිබුණි. කෙසෙ වෙතත් 2013 ජූනි 28 දින වන විටත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

4. ගිණුම් කටයුතු භාවය සහ යහ පාලනය
-----------------------------------------

4.1 අයවැය පාලනය
------------------

අරමුදල යටතේ වාර්ෂිකව වියදම් දැරීමක් සදු නොවන බැවින් සමාලොචිත වර්ෂය වෙනුවෙන් අයවැය ලේඛනයක් පිළයෙල කර නොතිබුණි.

5. පද්ධති හා පාලනයන්
-------------------------

පහත සඳහන් පද්ධති හා පාලන කෂේත්‍රයන් කෙරෙහ අවධානය යොමු කළයුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) අත්තිකාරම්පියවීම

(ඇ) ණයගැති/ ණයහිමි පාලනය

(ඈ) සථාවර වත්කම්